# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date. 2023-02-08 |
|---|---|---|

පැමිණිලි පාර්ශවය : ටී.එච්.චමිලා හංසණි ප්‍රනාන්දු මිය,
අංක. 100/49, ධර්මරාජ මාවත,
මහනුවර.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
මහ/ධර්මරාජ විද්‍යාලය,
මහනුවර.

**පැමිණිලි අංකය : HRC/K/133/22/A**

**පැමිණිලි පාර්ශවයේ සැළකිරීම :-**

ඉහත නම් සඳහන් පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා උක්ත ලිපිනයේ උපන්දා සිටම පදිංචිව සිටින බවත්, තමාගේ විවාහයෙන් පසුවද මෙම ස්ථානයේම පදිංචිව සිටි අතර, තමාගේ දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් කිරීමට අදාළව අයදුම්පත් යොමු කරන ලද අතර, එකී සම්මුඛ පරික්ෂණයට ඉදිරිපත් කරන ලද පදිංචි ස්ථානයේ ඔප්පුව සම්බන්ධයෙන් ගැටළුකාරි තත්වයක් මතුවූ බවත්, තමා ඉදිරිපත් කළ ඔප්පුවෙහි තම පියාට හා තමාගේ සහෝදරයා යන දෙදෙනාටම හිමිකම් සඳහන් වී ඇති බැවින් එකී ඔප්පුව ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කළ බවත්, ඒ හේතුව නිසාම සම්මුඛ පරික්ෂණයට ඉදිරිපත් කළ අනෙකුත් ලේඛනවලටද කිසිදු ලකුණක් ලබානොදී සම්මුඛ පරික්ෂණයෙන් තමා ඉවත් කළ බවත්ය.

තමාගේ පියාට හා තම අවිවාහක සහෝදරයාට එකී ඔප්පුව සම අයිතියක් ඇති බවත්, තමා හා ස්වාමිපුරුෂයා මෙම දේපලෙහි පදිංචි වී සිටීම තම සහෝදරයාටද ගැටළුවක් නොවන අතර, තමා වෙනම නිවසක් තනාගෙන ස්වාමිපුරුෂයා හා දරුවන් සමඟ සිටින බවත්, මෙම දේපලේ තමාගේ පියාට හිමි කොටස නීත්‍යානුකූලව තමා වෙත පවරාදීමට කටයුතු සිදුකරමින් සිටින බවත්, තමාට ඇති ආසන්නම




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පාසල මෙම මහනුවර ධර්මරාජ පාසල වන අතර, ඔප්පුව පමණක් සලකා බලා සම්මුඛ පරීක්ෂණයෙන් තම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීම තුළින් තමාට අසාධාරණයක් සිදුව ඇති බැවින් ඒ හේතුවෙන් තම දරුවාට මෙම පාසලට ඇතුළත්වීමට අවස්ථාව නොමැති වූ බවත්, මේ පිළිබඳව සලකා බලා තමාට සාධාරණයක් ඉටුකර දෙන ලෙස ඉල්ලා සිටින බවත් දක්වා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම :-**

පැමිණිල්ලේ වගඋත්තර පාර්ශවය වාර්තාවක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, අයදුම්කරුවකු විසින් සිය ස්ථිර පදිංචි ස්ථානයට ඇති අයිතිය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන අයදුම්කරුගේ මව හෝ පියාට නීත්‍යානුකූලව අයිති දේපලක් සඳහා එම කලත්‍රයන් දෙපල හැර වෙනත් පුද්ගලයෙකුට නීත්‍යානුකූල අයිතියක් ඇත්නම්, එම දේපල ඔප්පු නිරවුල් අයිතියක් නොමැති ඔප්පු ලෙස සලකා ප්‍රතික්ෂේප කිරීමට විද්‍යාලීය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඒකමතිකව තීරණය කරන ලද බවත්,

කැඳවුම් අංක RS -290 යටතේ ඉදිරිපත් වූ පැමිණිලිකාරිය තම දරුවා පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම වෙනුවෙන් තම ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අංක 1034 දරණ ඔප්පුවේ සඳහන් දේපල ඇයගේ පියා හා සහෝදරයාටද අයත් වන බව පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කරන ලද ලේඛන අනුව සනාථ වූ බවත්, ඒ අනුව වෙනත් ලේඛන සඳහාද ලකුණු ලබාදීමක් සිදුනොකරන ලද බවත් දක්වා ඇත.

ටී.එච්.සී.එච්.ප්‍රනාන්දු මිය විසින් මෙම විද්‍යාලයේ පළමු වසර සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත 13/2021 චක්‍රලේඛනයේ 6.1 අ i උපලේඛනයේ සඳහන් කරුණු ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කළ බවත් දක්වා ඇත.

**පරීක්ෂණ හා විමර්ශන කටයුතු වලින් අනාවරණය වී ඇති කරුණු :-**

01. පැමිණිලිකාරිය තම දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ පළමු වන වසර සඳහා 2022 වර්ෂයේදී ඇතුළත් කිරීමට අයදුම්කර කැඳවුම් අංක 290 යටතේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ඇත.

02. පැමිණිලිකාරියගේ පදිංචි ස්ථානයේ හිමිකම් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇත්තේ, තම පියාට හා සහෝදරයාගේ නමින් ඇති ඔප්පුව වන අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අදාළ ඔප්පුව ප්‍රතික්ෂේප කර ඇත.

03. පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති ඔප්පුව ඇයගේ පියාට හා සහෝදරයා යන දෙදෙනාටම අයත් බැවින් එහි සමඅයිතිය දෙපාර්ශවයටම පවතින බැවින්, පැමිණිලිකාරියගේ පියාට ඇති හිමිකම අනුව පැමිණිලිකාරියට හිමි ලකුණු ප්‍රමාණය දියයුතු නමුත්, එම ලකුණු නොදීම අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය චක්‍රලේඛනයට පටහැනිව කටයුතු කර ඇති බව තහවුරු වේ.

04. පැමිණිලිකාරිය පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඔප්පුවට ලකුණු ලබානොදුන්නද පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කරන ලද අනෙකුත් ලේඛන සලකා බලා ඉතිරි කොටස් සඳහා ලකුණු ලබාදීමේ හැකියාව චක්‍රලේඛනයේ 7.2.1 සිට 7.2.4 අනුව හැකියාව පවතින නමුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඒ සඳහා කටයුතු කර නොමැත.

05. ඉහත සඳහන් අංක 3 හා 4 හී සඳහන් අවස්ථාවලදි ලකුණු ලබාගැනීමේ හැකියාව පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙතින් කරන ලද 2022.08.15 දිනැති විමසීමට පිළිතුරු ලෙස මෙම කොමිසම වෙත යොමුගත අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාසල් කටයුතු) ගේ 2022.11.02 දිනැති ලිපිය මඟින්ද දන්වා ඇත්තේ, පදිංචි ස්ථානයේ හිමිකම් සනාථ කිරිම සම්බන්ධව අදාළ ලේඛන මඟින් ලකුණු උපයාගත නොහැකි නමුත් වෙනත් පිළිගත හැකි ලේඛන හෝ අදාළ ස්ථානයේ උපන්දා සිට පදිංචිව සිටින බවට තහවුරු කිරිම යන අවස්ථාවන් යටතේද දක්වා ඇති නියමිත සුදුසුකම් සපුරාලීම මඟින් අයදුම්කරුවකුට ලකුණු උපයාගැනීමට උක්ත චක්‍රලේඛනයෙන් අවස්ථාව සලසාදී ඇති බවයි.

**නිගමනය :-**

මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 2022 වර්ෂයේ පළමු වසරට ළමුන් ඇතුළත් කර ගැනිමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් චක්‍රලේඛනයට පටහැනිව පැමිණිලිකාරියට ලබාදිය හැකි ලකුණු ලබානොදිමෙන් වගඋත්තර පාර්ශවය 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති නීතිය ඉදිරියේ සමාන ලෙස සැළකීම ලැබීමට ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, වඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී ඇති බැවින්, පැමිණිලිකාරියගේ දරුවා 2022 වර්ෂයේ මහනුවර

ධර්මරාජ විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කළයුතු බවට මෙයින් නිර්දේශ කරමි.

2023. 03 . 10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ (ජාතික පාසැල්)
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

03. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

04. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/